# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } RG/MBD/1/22

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
**HEAD OFFICE**

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. } 565

ඔබේ අංකය / உமது இல. / Your No. }

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date } 2021.02 [illegible]


සියලුම දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,

<u>**විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම - 2020 වර්ෂය**</u>

උක්ත ශීර්ෂයෙන් මාගේ සමාංක හා 2020.10.15 දිනැතිව යොමු කරන ලද අංක 10/2020 වන චක්‍ර ලේඛය හා එහි ඇමුණුම සම්බන්ධයෙනි.

02. ඒ අනුව උක්ත චක්‍රලේඛය සමඟ මා විසින් ඔබ වෙත යොමු කරන ලද I වන ඇමුණුම වන "විවාහ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීම පිළිබඳ අත්පොත III වන කාණ්ඩය I වැනි පරිච්ඡේදයේ"

- අංක 18 (02) අංක (i) "අයදුම්කරුගේ වයස අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 නොඉක්මවිය යුතු බව." ලෙස ද

- අංක 18 (02) අංක (ii) "අ.පො.ස. (සා.පෙළ) භාෂාව විෂයට (තනතුරට අදාළ භාෂා මාධ්‍යය) සම්මාන සාමාර්ථයක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් සම්මාන දෙකක් සහිතව විෂයන් හයකින් සමත්ව තිබිය යුතු බව" ලෙස ද

II වන ඇමුණුම වන "විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීම", "අ" උපලේඛනයේ ,

- අංක 06. I හි වයස යන කරුණ "අයදුම්කරුවන්ගේ වයස අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 55 නොඉක්මවිය යුතුය." ලෙස ද

- අංක 08 මූලික අධ්‍යාපන සුදුසුකම් හි අංක i හා ii හි සඳහන් කරුණු "කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමඟ දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයන් 06 කින් සමත්ව සිටිය යුතුය. නැතහොත් ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතුය." ලෙස ද

සංශෝධනය කරන බව කාරුණිකව දන්වමි.

03. ඒ අනුව ඔබට එවා ඇති ඇමුණුම I සහ II හි මෙම සංශෝධන ඇතුළත් කර ගන්නා ලෙසත්, තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම ද ඇතුළත්ව අදාල පරිදි අනෙක් සෑම ලේඛනයකම එම සංශෝධන ඇතුළත් කර ගැනීමට කටයුතු සිදු කරන ලෙසත් වැඩි දුරටත් දන්වමි.

04. තවද මෙම සංශෝධනයන්ට අදාලව ගැසට් නිවේදන සංශෝධනය කිරීම සඳහා වූ ඉදිරි කටයුතු සිදු වෙමින් පවතින බව ද කාරුණිකව දන්වමි.

ඩබ්.එම්.එම්.බී. වීරසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්

01. ලේකම්, රාජ්‍ය ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය - දැ.ගැ.ස.
02. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - දැ.ගැ.ස.
03. කලාප භාර සියලුම සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැ.ගැ.ස.
04. සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් - දැ.ගැ.ස.
05. සියලුම අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් (ප්‍රා.ලේ. කාර්යාල) - දැ.ගැ.ස.

331